// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2235/29 - 2021 ජූලි මස 06 වැනි අඟහරුවාදා - 2021.07.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ අංක 07 කුරුඳුවත්ත කොට්ඨාසයට තේරී පත්වූ මොහමඩ් නයිම් හුසෙයින් කියාස් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ අංක 07 කුරුඳුවත්ත කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තෙල්ලඹුරේ හෙට්ටිගේ කුලරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කන්ද උඩ චන්ද්‍රලාල් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් තෙල්ලඹුරේ හෙට්ටිගේ කුලරත්න, බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ අංක 07 කුරුඳුවත්ත කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්තර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. යූ. චන්ද්‍රලාල්,**
තේරීම්භාර නිලධාරි,
බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාව.

2021 ජූලි මස 01 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07 - 359

1A - G 34583 — 30 (2021/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*